## 263 කිතු සමිඳුන් ජය දද

කිතු සමිඳුන් ජය දද සෙවනේ
එකමුතු වෙමු අපි හේද වරා
මිතු දහමින් බැඳෙමින් දෙරණේ
පියලමු දැය බැති කීල අරා

පෙරලෙන පස මත අස්වනු පීදෙන
සරු බව ඔබ සමිඳේ සමිඳේ
පිබිදෙන පියුමක රොන් රස වැහෙන
අරුමය ඔබ සමිඳේ සමිඳේ

දිවමන් සතු හිමි සේම පෙරට යමු
යුතුකම් තිති පහදා පහදා
අභිමන් සිරිලක ලොවම පසිඳු කර
කිතුනම එහි රඳවා රඳවා

ගුණ දම් සුරකිනු නැර පැරණි කර
මුරුත් නැමද සැමදා සැමදා
සැනසුම් ලොවකට පාර සදමු අපි
අලස නොවී නොනිදා නොනිදා